# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# முகாமைத்துவ சேவைகள் திணைக்களம்

# Department of Management Services

# 2013

## වාර්ෂික කාර්යසාධන වාර්තාව

## வருடாந்த செயலாற்றுகை அறிக்கை

## Annual Performance Report

මහා භාණ්ඩාගාරය, කොළඹ - 01

**பொதுத் திறைசேரி, கொழும்பு - 01**

**General Treasury, Colombo - 01**


දුරකථන
தொலை பேசி : 011 - 2484757
Telephone

ෆැක්ස්
தொலை நகல் : 011 - 2430270
Fax

ඊ-මේල්
மின் அஞ்சல் : dgms@msd.treasury.gov.lk
E-mail

# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 2013

## වාර්ෂික කාර්යසාධන වාර්තාව


**මහා භාණ්ඩාගාරය**

**කොළඹ - 01**

දුරකථන : 011 -2484757

ෆැක්ස් : 011-2430270

ඊ-මේල් : dgms@msd.treasury.gov.lk

# දැක්ම

රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වීම

# මෙහෙවර

රාජ්‍ය සේවය විශිෂ්ට මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය කළමනාකරණ සහාය රාජ්‍ය ආයතන වෙත ලබාදීම

## අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ..........................

රාජ්‍ය අංශයේ විවිධ ක්ෂේත්‍ර තුළ කාලීනව පැන නගින මානව සම්පත් අවශ්‍යතාවයන් ද රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන්ද සැලකිල්ලට ගෙන රාජ්‍ය අංශය තුළ ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීමේ අභියෝගාත්මක කාර්යයට 2013 වර්ෂයේදී සාර්ථකව මුහුණ දීමට හැකිවිය.

නව ජවයකින් ඉදිරියට යන සංවර්ධන ප්‍රවේශය තුළ රජය විසින් සැලසුම් කර ඇති සීඝ්‍ර ආර්ථික හා සමාජ අභිවෘද්ධි ඉලක්ක ළඟා කර ගැනීමේ ක්‍රියාවලියේ දී රාජ්‍ය සේවාවන් කාර්යක්ෂම ලෙස සලසා දෙමින් සංවර්ධන ක්‍රියාවලිය පහසු කිරීමටත් මහජනතාව තෘප්තිමත් වන අයුරින් නිවැරදි, කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් ලබා දීමටත් හැකි වන පරිදි රාජ්‍ය අංශයේ මානව සම්පත වඩාත් යෝග්‍ය හා ඵලදායී අයුරින් කළමනාකරණය කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරයයි. ඒ අනුව 2013 වර්ෂය, යථෝක්ත කාර්යභාරය සඵලමත් කර ගැනීම අරභයා සාධනීය දායකත්වයක් ලබාදීමට හැකි වූ වසරක් බව ප්‍රකාශ කරනුයේ හදපිරි සතුටිනි.

අප දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම උදෙසා සාකල්‍යයෙන්ම නිසි මග පෙන්වීම හා සහයෝගය ලබා දුන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් හා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මැතිතුමාට, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්ට සහ සහෝදර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මාගේ හදපිරි ප්‍රණාමය පුද කරමි. අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි උපදෙස් හා මාර්ගෝපදේශ ලබා දෙමින් සහයෝගය දැක්වූ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිලධාරීන්ට ද වැදගත් කාර්යයක් ඉටු කරමින් සහයෝගය පල කළ මුදල් කොමිෂන් සභාව සහ සියළුම රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්ට ද මාගේ ප්‍රණාමය පුද කරමි. තව ද, සංවිධානාත්මකව, කණ්ඩායම් හැඟීමෙන් හා සහයෝගයෙන් යුක්තව දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කළ කාර්ය මණ්ඩලයට ද ප්‍රශංසාව පිරිනමමි.

**එන්. ගොඩකන්ද**

**අධ්‍යක්ෂ ජනරාල්**

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 2. | කාර්ය මණ්ඩල කළමනාකරණය | 3 |
| 3. | වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය | 9 |
| 4. | පර්යේෂණ කටයුතු, තොරතුරු හා දත්ත පද්ධතිය | 10 |
| 5. | ආයතන අංශය | 13 |
| 6. | මූල්‍ය අංශය | 22 |


## උපලේඛන


| | | |
|---|---|---|
| I. | සංවිධාන ව්‍යුහය | 24 |

# 1. හැඳින්වීම

## 1.1 ආරම්භය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ පළමු ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස 1999 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරනු ලැබීය. එතැන් සිට ජාතික, පළාත් හා පළාත් පාලන මට්ටමින් රාජ්‍ය අංශයේ සේවා අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් ආයතනික මට්ටමින් අවශ්‍ය වන ප්‍රශස්ත කාර්ය මණ්ඩලය හඳුනාගැනීමත්, එම හඳුනාගන්නා තනතුරුවලට අදාළ වැටුප් සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමත්, බඳවා ගැනීම් /උසස් කිරීම් පරිපාටි සඳහා අනුමැතිය ලබාදීමත් ආදී කටයුතු මගින් රාජ්‍ය අංශයේ මානව සම්පත ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය සපයා ඇත. මෙහිදී රටේ මූල්‍ය තත්ත්වය, සංවර්ධන විභවතාවය, කුසලතා පූර්ණ රාජ්‍ය සේවයක් ඇති කිරීම වැනි අංශ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම ඉතා අත්‍යවශ්‍ය විය. මේ සඳහා කාලීන අවශ්‍යතා පරිදි අදාළ අනෙකුත් ආයතන සමඟද මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කාර්ය මණ්ඩල සමාලෝචන තුළින් රාජ්‍ය අංශයට අවශ්‍ය ප්‍රශස්ත මානව සම්පත් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත.

## 1.2 පරමාර්ථ

වඩාත් ඵලදායී මානව සම්පතක් රාජ්‍ය අංශය තුළ ස්ථාපිත කිරීම උදෙසා පරමාර්ථ කිහිපයකින් මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

i. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය
ii. ජාතික වැටුප් ප්‍රතිපත්තීන්ට අනුකූලව වැටුප් හා දීමනා තීරණය කිරීම
iii. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳව අධ්‍යයන සිදු කිරීම

## 1.3 කාර්යභාරය

i. ජාතික වැටුප් කොමිෂන් සභාවට/අග්‍රස්ථ ආයතනයන්ට සේවා සැපයීම.
ii. රාජ්‍ය අංශයෙහි ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබඳ අන්වේෂණය පවත්වා ගැනීම.
iii. මෙහෙවර, පරමාර්ථ, ක්‍රම පද්ධති, පරිපාටි සහ කාර්ය මණ්ඩල සම්පාදනය පිළිබඳ ආයතනික සමාලෝචන පවත්වා අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
iv. රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා නිසි ප්‍රමාණයට සැකසීම අරමුණු කොට ගෙන රාජ්‍ය අංශයේ ආයතනවල ද්විත්වකාරක (Duplicating) කාර්යයන් හඳුනා ගැනීම.
v. රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව හා සඵලතාවය සහතික කිරීමේ අදහස පෙරදැරිව ආයතනික හා කාර්ය මණ්ඩල සමාලෝචන පැවැත්වීම, ක්‍රම පද්ධති වැඩි දියුණු කිරීම, සංවිධාන ව්‍යුහයන් ගොඩනැඟීම හා ශක්තිමත් කිරීම.
vi. සේවක සංඛ්‍යා අවශ්‍යතාවයන් පිළිබඳ සම්මත මිණුම් සහ ප්‍රමිතීන් ගොඩනගා ගැනීම.
vii. අතිරික්ත සේවක සංඛ්‍යාවන් හඳුනා ගැනීම, ඔවුන් නැවත සුදුසු පරිදි යෙදවීම සහ සේවාහරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

viii. භෞතික පරිසරය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයන්, යාන්ත්‍රීකරණය/පරිගණකගතකරණය සහ සේවාවන් කොන්ත්‍රාත් දීම සඳහා වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

ix. සංවර්ධන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සේවා ව්‍යවස්ථා, සේවා කොන්දේසි සමාලෝචනය පිළිබඳ අධ්‍යයනයන්හි යෙදීම සහ යෝජනා ඉදිරිපත් කිරීම.

x. රාජ්‍ය අංශය තුළ විශ්‍රාමික නිලධාරීන් යළි සේවයේ යෙදවීම, උපදේශකයින් යොදවා ගැනීම පිළිබඳ යෝජනා පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම.

xi. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයෙහි කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පද්ධති පවත්වා ගැනීම සහ අති වැදගත් තනතුරු සඳහා අනුප්‍රාප්තිය සැලසුම් කිරීම.

xii. බඳවා ගැනීමේ ප්‍රතිපත්ති, දක්ෂතා සංවර්ධන පුහුණු සහ අනුප්‍රාප්තිය සැලසුම් කිරීම පිළිබඳ අධ්‍යනයන්හි සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා අදාළ බලධාරීන්ට සහාය වීම.

xiii. රාජ්‍ය අංශයේ වැටුප් සහ ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම, සුභ සාධක යෝජනා ක්‍රම සහ වෙනත් එවැනි පාරිශ්‍රමික සංවිහිතීන් පිළිබඳ කළමනාකරණය.

xiv. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනික සමාලෝචනය, සේවක සංඛ්‍යා සහ වැටුප් කළමනාකරණය පිළිබඳව උපදේශාත්මක සේවා සැලසීම.

xv. රාජ්‍ය හා සංස්ථා අංශ සඳහා වෘද්ධෝපගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිළිබඳ අධ්‍යයනයන්හි නිරත වීම.

# 2. කාර්ය මණ්ඩල කළමනාකරණය

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේදී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත සඳහන් ප්‍රධාන කාර්යයන්ගෙන් සමන්විත වේ.

- නව තනතුරු අනුමත කිරීම
- පුරප්පාඩු පිරවීම අනුමත කිරීම
- තනතුරු යටපත් කිරීම
- තනතුරු නාම සංශෝධනය කිරීම
- රාජ්‍ය ව්‍යාපෘතීන් සඳහා වූ ව්‍යාපෘති කළමනාකරණ කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් තීරණය කිරීම

රාජ්‍ය අංශය වෙත පැවරී ඇති කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගත යුතුවේ. ඒ අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ව්‍යාපෘතින්හි කාලීනව පැන නගින මානව සම්පත් අවශ්‍යතාවයන්ද රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන්ද සැලකිල්ලට ගෙන ආයතන තුළ ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2013 වර්ෂය තුළ සිය කාර්යභාරය ඉටු කරන ලදී.

## 2.1 රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය හා ආංශික සංයුතිය

2013.12.31 දිනට ජාතික, පළාත් හා පළාත් පාලන ආයතන ඇතුළු රාජ්‍ය අංශයේ සමස්ථ සේවා නියුක්තිය 1,298,529 ක් විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, බැංකු හා මූල්‍ය ආයතන ඇතුළත් රාජ්‍ය ව්‍යවසායන්, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ ආරක්ෂක හමුදාවන්ගෙන් සමන්විත රාජ්‍ය අංශයේ සමස්ථ කාර්ය මණ්ඩල සංයුතිය පහතින් දැක්වේ.

**වගු අංක - 01**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 2013**

| පරිපාලන මට්ටම | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජාතික මට්ටම | 1,041,953 | 922,777 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 391,647 | 375,752 |
| **එකතුව** | **1,433,600** | **1,298,529** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.2 රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය - 2013

මහජනතාව වෙත කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් සැපයීම අරමුණු කර ගනිමින් හා නව රාජ්‍ය ප්‍රතිපත්තීන් අනුව ආර්ථික සංවර්ධන කටයුතු පහසු කිරීම උදෙසා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුළු රාජ්‍ය අංශය සඳහා 2013 වසර තුළදී ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වාගෙන යාමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව රාජ්‍ය සේවයේ තනතුරු ජ්‍යෙෂ්ඨ, තෘතීය, ද්විතීය හා ප්‍රාථමික වශයෙන් මට්ටම් හතරකින් සමන්විත වේ. සේවා මට්ටම් අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා වර්ගීකරණය වගු අංක 02 යටතේ දැක්වේ.

**වගු අංක - 02 සේවා මට්ටම් අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා වර්ගීකරණය - 2013**

| පරිපාලනමය මට්ටම | සේවා මට්ටම | | | | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ | තෘතීය | ද්විතීය | ප්‍රාථමික | |
| ජාතික | 27,743 | 27,090 | 721,640 | 146,304 | 922,777 |
| පළාත් සභා | 13,681 | 15,313 | 236,589 | 60,873 | 326,456 |
| පළාත් පාලන ආයතන | 999 | 739 | 15,598 | 31,960 | 49,296 |
| මුළු එකතුව | **42,423** | **43,142** | **973,827** | **239,137** | 1,298,529 |
| ප්‍රතිශතය % | **3** | **3** | **75** | **19** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

කළමනාකරණ මට්ටමේ වගකීම් දරන ඉංජිනේරුවරුන්, අධිකරණ, නීති, වෛද්‍ය නිලධාරීන් සහ විධායක නිලධාරීන් ජ්‍යෙෂ්ඨ මට්ටම නියෝජනය කරමින් සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 3 ක ප්‍රතිශතයක් හිමිකර ගනී. අධීක්ෂණ කාර්යභාරය පැවරී ඇති විධායක මට්ටමට සහාය වන පරිපාලන, සැලසුම්, ගිණුම්, නියාමන, බදු සහ බලාත්මක යන කාර්යන්හි නියුතු නිලධාරීන් හා භාෂා පරිවර්තක නිලධාරීන් තෘතීය මට්ටම වශයෙන් සමස්ත රාජ්‍ය අංශයට සියයට 3 ක දායකත්වයක් සපයනු ලබයි. සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සහකාර නිලධාරීන්, හෙද නිලධාරීන්, ගුරුවරුන්, ත්‍රිවිධ හමුදා සොල්දාදුවන්, පොලිස් කොස්තාපල් වැනි නිලධාරීන්ගෙන් සමන්විත ද්විතීය මට්ටම රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තියෙන් සියයට 75 ප්‍රතිශතයක් නියෝජනය කරයි. මින් පිළිබිඹු වන්නේ අධ්‍යාපන, සෞඛ්‍ය වැනි සේවා දීපව්‍යාප්තව සැපයීම සඳහා ගුරුවරුන් හා හෙද නිලධාරීන් ද රටෙහි ග්‍රාමීය කේන්ද්‍රික සේවා සැපයීම හා ග්‍රාමීය සංවර්ධන කටයුතු වෙනුවෙන් ව්‍යාප්ති නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් ද බහුල වශයෙන් සේවා නියුක්ත කර ඇති ආකාරයයි. සමස්ත රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවෙන් සියයට 19 ක් නියෝජනය කරන රියදුරු, කාර්යාල සහායක වැනි සේවක කාණ්ඩයන් ප්‍රාථමික මට්ටමේ සහාය සේවා සපයනු ලබයි.

### 2.2.1 නව තනතුරු ඇතිකිරීම - 2013

තනතුරු අලුතින් ඇතිකිරීමේ දී අදාළ ආයතනවලට පැවරී ඇති කාර්යභාරය, රටේ මූල්‍ය ශක්‍යතාවය හා අයවැය ප්‍රතිපාදන මෙන්ම තනතුරු අලුතින් ඇති කිරීමේ කාලීන අවශ්‍යතාවයද සැලකිල්ලට යොමු කරන ලදී. රාජ්‍ය අංශය සඳහා තනතුරු අලුතින් ඇති කිරීම පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා ව්‍යවස්ථාපිත මණ්ඩල මට්ටමින් කරන ලද වර්ගීකරණය 2010-2013 අතර සංසන්දනාත්මක තොරතුරු සමඟින් පහත වගු අංක 03 මඟින් දක්වා ඇත.

**වගු අංක - 03 නව තනතුරු ඇති කිරීම**

| ආයතනය | 2010 | | 2011 | | 2012 | | 2013 | |
|---|---|---|---|---|---|---|---|---|
| | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු | 1,923 | 36.3 | 2,893 | 73.3 | 38,368 | 78.1 | 15,315 | 77.0 |
| පළාත් සභා | 2,811 | 53.0 | 523 | 13.2 | 8,572 | 17.4 | 3,093 | 16.0 |
| ව්‍යවස්ථාපිත මණ්ඩල | 568 | 10.7 | 534 | 13.5 | 2,217 | 4.5 | 1,330 | 7.0 |
| **එකතුව** | **5,302** | **100** | **3,950** | **100** | **49,157** | **100** | **19,738** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

මේ අනුව 2013 වර්ෂය සඳහා ඇති කරන ලද නව තනතුරු අතරින් සියයට 77 ක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා විය.

### 2.2.2 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම - 2013

2007.08.01 හා 2007.10.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 36 හා 36 (I) මඟින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් MN, MT, SL හා PL වැටුප් ක්‍රමයන්ට අදාළ තනතුරු දරන නිලධාරීන් විශ්‍රාම ගැනීම/ඉල්ලා අස්වීම/මියයාම/සේවය අතහැර යාම වැනි හේතු නිසා රාජ්‍ය සේවයේ හා පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවයේ ඇතිවන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම්/පත් කිරීම් සඳහා බලතල අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත පැවරීමට කටයුතු කර ඇත. එසේ වුවද මෙම චක්‍රලේඛ උපදෙස් මඟින් ආවරණය නොවන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා තවදුරටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය විය. ඒ අනුව සේවා අවශ්‍යතාවයන් පිළිබඳ අවධානය යොමු කරමින්, 2013 වසර තුළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන වෙතින් ලද ඉල්ලීම් අනුව තනතුරු පුරප්පාඩු 10, 417 ක් සම්පූර්ණ කිරීම සඳහා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා දී ඇත.

**වගු අංක - 04 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම - 2013**

| ආයතනය | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| අමාත්‍යාංශ | 4,683 | 45 |
| දෙපාර්තමේන්තු | 2,673 | 26 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 1,788 | 17 |
| ව්‍යවස්ථාපිත ආයතන | 1,273 | 12 |
| **එකතුව** | **10,417** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 2.2.3 තනතුරු යටපත් කිරීම හා තනතුරු නාම සංශෝධනය

රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලබා දීම හා තනතුරු අලුතින් ඇති කිරීමට පමණක් සීමා නොවේ. රාජ්‍ය ආයතනවල පවතින ඵලදායී හා කාලීන නොවන තනතුරු හඳුනා ගැනීම, අදාළ ආයතනවල ද එකඟතාවය සහිතව එම තනතුරු යටපත් කිරීම, කාලීන අවශ්‍යතාවයන් අනුව තනතුරු නාම සංශෝධනය කිරීම, රාජකාරි ස්වභාවයන් අනුව පවතින තනතුරු ඒකාබද්ධ කිරීම වැනි කටයුතුද දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් අතරට ගැනේ. මෙම කටයුතු ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුව සතු දත්ත පද්ධතිය හා පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලයේ දායකත්වය ඵලදායී ලෙස යොදා ගැනේ. 2010 - 2013 අතර කාලය තුළ රාජ්‍ය අංශයේ යටපත් කරනු ලැබූ තනතුරු පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු වගු අංක 05 මඟින් දක්වා ඇත.

**වගු අංක - 05 තනතුරු යටපත් කිරීම**

| ආයතනය | යටපත් කරන ලද තනතුරු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2010** | **2011** | **2012** | **2013** |
| අමාත්‍යාංශ | 12 | 32 | 95 | 179 |
| දෙපාර්තමේන්තු | 174 | 512 | 1853 | 494 |
| පළාත් සභා හා පළාත් පාලන ආයතන | 329 | 62 | 66 | 1 |
| ව්‍යවස්ථාපිත ආයතන | 24 | 66 | 8 | 33 |
| **එකතුව** | **539** | **672** | **2022** | **707** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 2.2.4 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් කළමනාකරණය

ජාතික හා පළාත් මට්ටමින් රට තුළ ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන ව්‍යාපෘති, සැළසුම් ගත කාල වකවානු තුළ නිම කිරීමට අවශ්‍ය වන කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබාදීම හා එම තනතුරුවලට අදාළ වැටුප් තීරණය කිරීම 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33හි විධිවිධාන අනුව සිදු කෙරේ. 2013 වසර තුළදී ද මෙම කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන රේඛීය අමාත්‍යාංශ/පළාත් සභා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉහළ සහයෝගයක් ලබා දුනි.

**වගු අංක - 06 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම - 2013**

| අනු අංකය | ව්‍යාපෘතිය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජාතික මාර්ග ජාලය නායයාම් ආපදාවලින් ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය | 12 |
| 02 | දේශීය බැංකු මගින් මූල්‍යනය වන මාර්ග ව්‍යාපෘතිය | 185 |
| 03 | විශේෂ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය<br>(කලින් පැවති ජපන් ආධාර මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය) | 22 |
| 04 | කොළඹ වෘත්තීය පුහුණු ආයතනය ස්ථාපිත කිරීම සහ ගම්පහ කාර්මික විද්‍යාලය වැඩි දියුණු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය | 09 |
| 05 | මහනුවර නගර අපජල ව්‍යාපෘතිය | 26 |
| 06 | කොළඹ ජලසම්පාදන සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය<br>(ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ලබන) | 96 |
| 07 | කිලිනොච්චි ජලසම්පාදන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම | 17 |
| 08 | අනුරාධපුර - උතුරු ජලසම්පාදන ව්‍යාපෘතිය | 10 |
| 09 | වියලි කලාපයීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 12 |
| 10 | බදුල්ල, හාලි ඇල සහ ඇල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | 29 |
| 11 | මහියංගන ජල සම්පාදන ව්‍යාපෘතිය | 12 |
| 12 | යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂණ ව්‍යාපෘතිය | 29 |
| 13 | මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය | 04 |
| 14 | විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය | 30 |
| 15 | කිරම - කටුවන ජල සම්පාදන ව්‍යාපෘතිය | 13 |
| 16 | මොනරාගල - බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතිය | 25 |
| 17 | ගම්පහ - අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය | 38 |
| 18 | විසල් කුරුණෑගල ජලපවහන ව්‍යාපෘතිය | 06 |

| | | |
|---|---|---|
| 19 | සුළු හා මධ්‍යම ව්‍යාපාර අංශය සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘතිය | 03 |
| 20 | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය - කොළඹ නගරය | 217 |
| 21 | ශ්‍රී ලංකා පශ්චාත් සුනාමි නැගෙනහිර පළාත් සහභාගීත්ව වෙරළ කලාප ප්‍රතිස්ථාපනය හා තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය | 03 |
| 22 | කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 01 |
| 23 | මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 12 |
| 24 | 2013-2017 අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වූ ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය ආධාර වැඩසටහන | 11 |
| 25 | අළුත්වැඩියා කිරීමේ හා සංවර්ධනය කිරීමේ විදේශ ආධාර ව්‍යාපෘතිය | 18 |
| 26 | ගාල්ල මහමෝදර මාතෘ රෝහල ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 08 |
| 27 | කසල පිළිසරු ව්‍යාපෘතිය | 37 |
| 28 | දොම්පේ සනීපාරක්ෂක කසල බිම් ව්‍යාපෘතිය | 10 |
| 29 | මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය | 14 |
| 30 | දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 03 |
| 31 | ධීවර වරායන් සහ නැංගුරම්පල සංවර්ධනය කිරීමේ  ව්‍යාපෘතිය | 15 |
| | **එකතුව** | **708** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 2.2.5 පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් පිහිටු වූ පළාත් සභා විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් ගුණාත්මක, ඵලදායි හා කාර්යක්ෂම ලෙස සිදු කිරීම තහවුරු කරනු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේදී කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් තීරණය කරන ලදී. එසේ වුවද නව ආයතන පිහිටුවීම හා සේවා සැපයීම පුළුල්වීම හේතුවෙන් තවදුරටත් 2013 වසරේදී ද නව තනතුරු අනුමත කරන ලදී.

## 3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය අතර රාජ්‍ය අංශයේ වැටුප් හා ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම හා වෙනත් පාරිශ්‍රමික කළමනාකරණයද ඉතා වැදගත් ස්ථානයක් උසුලනු ලැබේ. මෙම කාර්යයේදී ජාතික වැටුප් කොමිෂන් සභාව හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නිරීක්ෂණ හා නිර්දේශද සැලකිල්ලට ගෙන අදාල තීරණ ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. වැටුප් හා පාරිශ්‍රමික පිළිබඳ ප්‍රායෝගික ගැටලු පැන නගින අවස්ථාවලදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් කරනු ලබන විමසීම්වලදී අවශ්‍ය උපදෙස් ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. 2013 වසරේදී ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අදාළ සංශෝධනයන්ට අනුරූපී වන පරිදි කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු මෙන්ම වැටුප් හා දීමනා තීරණය කිරීම ද සිදු කර ඇත. ඊට අදාලව 2013 වසර තුළදී දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛ පහත සඳහන් පරිදි වේ.

**වගු අංක - 07** **කළමනාකරණ සේවා චක්‍රලේඛ - 2013**

| චක්‍රලේඛ අංකය හා දිනය | විෂයය |
|---|---|
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2013 – 2013.11.15 | රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2013 වර්ෂ සඳහා ප්‍රසාද දීමනා ගෙවීම. |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2013(i) – 2013.12.09 | රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2013 වර්ෂ සඳහා ප්‍රසාද දීමනා ගෙවීම. |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 4. පර්යේෂණ කටයුතු, තොරතුරු හා දත්ත පද්ධතිය

## 4.1 පර්යේෂණ කටයුතු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන් අතරින් රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවන්ට අදාල වූ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳ සම්මත මිනුම් හා ප්‍රමිතීන් ගොඩනගා ගැනීම, වැටුප්, දීමනා හා අනෙකුත් පාරිශ්‍රමික පිළිබඳ අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම හා තීරණ ලබා දීම, වත්මන් සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රාජ්‍ය අංශයේ විවිධ සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසි සමාලෝචනයේදී අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි අවස්ථාවලදී දෙපාර්තමේන්තුවට අනෙකුත් ආයතන සමඟ සමීපව කටයුතු කිරීමට සිදු වේ.

මෙම කටයුතු අප්‍රමාදව හා නිවැරදිව සිදු කිරීමට දෙපාර්තමේන්තුව සඳහා කාර්යක්ෂම පර්යේෂණ අංශයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඵලදායීව ඉටු කිරීමේදී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා  තොරතුරු රැස් කිරීම හා එම තොරතුරු විශ්ලේෂණය කර වාර්තා සැපයීම පර්යේෂණ අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරය වේ. මෙහිදී අවශ්‍ය විමර්ශනයන්/අධ්‍යයනයන් සඳහා පර්යේෂණ අංශයේ නිලධාරීන් අදාළ ආයතන වෙත පෞද්ගලිකවම යොමු කර තොරතුරු රැස් කිරීම ද සිදු කෙරේ. මේ සඳහා දෙපාර්තමේන්තු පර්යේෂණ අංශයේ ධාරිතාවය පුළුල් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා නිලධාරීන් කණ්ඩායමක් හඳුනාගෙන බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

## 4.2 තොරතුරු හා දත්ත පද්ධතිය

රාජ්‍ය අංශයේ මානව සම්පත සම්බන්ධ නිවැරදි දත්ත හා තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ඉහළ වැදගත්කමක් උසුලයි. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය සහ උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වශයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට මෙහිදී වැඩි වගකීමක් පැවරේ. ඒ අනුව ඵලදායි හා ක්‍රමවත් පරිගණකගත දත්ත පද්ධතියක අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගනිමින්, 2012 - 2013 වර්ෂයන්හි නිර්මාණය කරන ලද, රාජ්‍ය අංශයන්හි අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාවන් ද ඇතුලත් දත්ත පද්ධතිය මේ වනවිට සාර්ථකව  ක්‍රියාත්මක වේ.

රාජ්‍ය අංශයේ මානව සම්පත සම්බන්ධ නිවැරදි සංඛ්‍යාත්මක තොරතුරු මෙම දත්ත පද්ධතියෙන් ලබා ගැනීමේ පහසුකම් වර්තමානයේ සලසා ඇත. ඒ අනුව වැටුප්, සේවාවන් හා කාණ්ඩ ආදී සේවක සංඛ්‍යා වර්ගීකරණයන් පිළිබඳ කරන ලද නිවැරදි තොරතුරු වාර්තා මෙම පද්ධතියෙන් අවශ්‍ය අවස්ථාවලදී පහසුවෙන් ලබා ගත හැකි වීම මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යයන් විශාල ලෙස පහසු වී ඇති අතර, සපයනු ලබන දත්ත හා තොරතුරුවල නිවැරදිතාවය වර්ධනය වී ඇත. මෙම දත්ත පද්ධතියේ අන්තර්ගත තොරතුරු යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු ද සලසා ඇත.

## 4.3 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

රාජ්‍ය අංශයේ ආයතන කටයුතු, වැටුප් හා දීමනා ආදී දෙපාර්තමේන්තු විෂය පථයට අයත්වන කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි. 2013 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා ඒවා අයත් වන විෂය ක්ෂේත්‍රය පිළිබඳව තොරතුරු වගු අංක 08 මගින් දක්වා ඇත.

**වගු අංක - 08 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා නිරීක්ෂණ වර්ගීකරණය**

| අනු අංකය | කාරණය/ක්ෂේත්‍රය | සංදේශ ගණන |
|---|---|---|
| 01 | තනතුරුවලට පත් කිරීම | 118 |
| 02 | සේවය දීර්ඝ කිරීම | 35 |
| 03 | නව තනතුරු ඇති කිරීම | 14 |
| 04 | පාරිශ්‍රමික | 70 |
| 05 | සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි | 38 |
| 06 | විනය කටයුතු | 08 |
| 07 | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම | 110 |
| 08 | අනෙකුත් | 106 |
| එකතුව | | 499 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

2013 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ලබා දෙන ලද මුළු අමාත්‍ය මණ්ඩල සංදේශ අතරින් තනතුරු සඳහා පත් කිරීම, සේවය දීර්ඝ කිරීම සහ පාරිශ්‍රමික සම්බන්ධ කරුණු ප්‍රධාන තැනක් ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට අමතරව නිතිපතා ද පැවැත්වෙන ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටු රැස්වීම් සඳහා ද දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ලබා දෙන ලදී. වසර 2003-2013 දක්වා දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු වගු අංක 09 මගින් දක්වා ඇත.

**වගුව අංක - 09 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම**

| වර්ෂය | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 863 | 562 | 605 | 820 | 780 | 750 | 1272 | 598 | 1019 | 399 | 499 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 4.4 කමිටු නියෝජන, සම්බන්ධීකරණ කටයුතු හා සන්නිවේදනය

සංවර්ධන හා ආයතන කටයුතු සම්බන්ධ පහත සඳහන් සමුළු හා සාකච්ඡා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා භාණ්ඩාගාර ලේකම් නියෝජනය කරමින් ක්‍රියාකාරී ලෙස දායකත්වය සපයා ඇත.

- ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළත්ව පත් කර ඇති නිලධාරී කමිටු
- රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA)
- දිස්ත්‍රික් ලේකම්/දිසාපති සමුළු
- ආණ්ඩුකාර සමුළු
- පළාත් ප්‍රධාන අමාත්‍ය සමුළු
- පළාත් ප්‍රධාන ලේකම් සමුළු
- ජාතික වැටුප් කොමිෂන් සභා සාකච්ඡා
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන කමිටු
- ව්‍යවස්ථාපිත ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම්
- ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු

තවද, විවිධ ආයතනයන්හි ඉල්ලීම් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් වශයෙන්ද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගී වී ඇත. එසේම, රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල ගැටළු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමග නිරන්තර සාකච්ඡා පවත්වනු ලැබේ. මේ අයුරින්, රාජ්‍ය අංශයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කරනු වස් එලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමට මෙම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි.

## 5. ආයතන අංශය

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමේදී දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ රැකියා තෘප්තිය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තුවේ භෞතික පරිසරය, රැකියා තෘප්තිය වර්ධනය කරලීමට සමත් මිත්‍රශීලී කාර්යාල පරිසරයක් සේ සකස් කර දීමටත්, ඵලදායී කණ්ඩායමක් සේ කටයුතු කිරීමට අවශ්‍ය සෙසු කාර්ය මණ්ඩලයට සහයෝගය ලබා දීමටත් ආයතන අංශය කටයුතු කරන ලදී.

2013 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව සතුව තිබූ මානව හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුතුව භාවිතා කිරීම තුළින් දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත සේවාවන් බාධාවකින් තොරව පවත්වා ගැනීමට සමත් විය. 2013.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩල තොරතුරු වගු අංක 10 මගින් දැක්වේ.

**වගු අංක - 10** **කාර්ය මණ්ඩල තොරතුරු 2013.12.31 දිනට**

| අනු අංකය | තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු / අතිරික්ත |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 02 | 01 | 01 |
| 03 | අධ්‍යක්ෂ | 07 | 02 | 05 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | 10 | 07 | 03 |
| 05 | ගණකාධිකාරී | 01 | 00 | 01 |
| 06 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 01 | 00 | 01 |
| 07 | පරිපාලන නිලධාරී | 01 | 01 | 00 |
| 08 | භාෂා පරිවර්තක | 01 | 01 | 00 |
| 09 | පර්යේෂණ සහකාර | 07 | 05 | 02 |
| 10 | තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 | 00 |
| 11 | සංවර්ධන නිලධාරී | 02 | 03 | -01 |
| 12 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 29 | 24 | 05 |
| 13 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 03 | 01 | 02 |
| 14 | රියදුරු | 06 | 05 | 01 |
| 15 | කාර්යාල කාර්ය සහායක | 07 | 07 | 00 |
| | **එකතුව** | **79** | **59** | **20** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

2013.12.31 දිනට දෙපාර්තමේන්තු සේවයේ නිරත වූ කාර්ය මණ්ඩලය පහත අංක 01 ලේඛනය මගින් දක්වා ඇත.

**ලේඛනය - 01** **කාර්ය මණ්ඩලය 2013.12.31 දිනට**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එන්. ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | ඒ.ආර්.උඩුවාවල මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර මයා | අධ්‍යක්ෂ |
| 04 | ලලිත් ආනන්ද මහතා | අධ්‍යක්ෂ |
| 05 | එම්.කේ.එස්. ජයසේන මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 06 | එස්.එන්. අත්තනායක මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ |
| 07 | එම්.ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 08 | චාමිකා මධුවන්ති මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| 09 | ඩබ්.එච්.ජී.ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ |
| 10 | ඩබ්.පී. සෙව්වන්දි මිය | සහකාර අධ්‍යක්ෂ |
| 11 | ඩබ්.ඩී.සේපාලිකා මිය | සහකාර අධ්‍යක්ෂ |
| 12 | ඒ.ආර්.පී.දයානි රාජපක්ෂ මිය | පරිපාලන නිලධාරී |
| 13 | පී.ඩී.ඩී. සමරසේකර මිය | භාෂා පරිවර්තක |
| 14 | එම්.ඩබ්. ජයන්ත මයා | පර්යේෂණ සහකාර |
| 15 | ආර්.කේ.ඒ. ක්‍රිශාන්ත මයා | පර්යේෂණ සහකාර |
| 16 | එස්.එම්.ඩී. සමරවීර මයා | පර්යේෂණ සහකාර |
| 17 | එම්.එම්.ඒ.එන්. මල්පෝරු මිය | පර්යේෂණ සහකාර |
| 18 | බී.එම්. සරත් මයා | පර්යේෂණ සහකාර |
| 19 | එම්.පී.එස්. සල්ගාදු මයා | තොරතුරු තාක්ෂණ සහකාර |
| 20 | ටී.එන්.රණසිංහ මෙනෙවිය | සංවර්ධන නිලධාරී |
| 21 | එස්.එස්.ඇල්පිටියගේ මිය | සංවර්ධන නිලධාරී |
| 22 | එච්.එස්.ඒ.හේනෙපොල මෙනෙවිය | සංවර්ධන නිලධාරී |
| 23 | ඩබ්.ටී.එම්. ප්‍රියන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 24 | වයි.එන්. කලුආරච්චි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 25 | කේ.පී. පද්මකාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 26 | එම්.එම්. අලුත්ගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 27 | එම්.ඩී.ආර්. රංජනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 28 | ඒ.එම්.එම්. ශ්‍යාමලී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 29 | ජී.එන්.එච්. අබයවර්ධන මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 30 | එම්.එන්.එම්. උසාමා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 31 | ජේ.ඒ.එන්. දේදුණු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 32 | එස්.එච්.එස්. පවිත්‍රා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 33 | කේ.අයි. පෙරේරා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 34 | කේ.එස්.එස්.ආර්. සෙනෙවිරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |

| | | |
|---|---|---|
| 35 | එච්.එල්. මංගලිකා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 36 | ඒ.එම්.ගුණරත්න මැණිකේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 37 | ඩී.පී.එස්.ජයසේකර මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 38 | ඒ.එම්.එස්.එස්.කේ.අරම්පත් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 39 | ඩබ්.ජේ.පේරුසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 40 | ආර්.රමණී මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 41 | ආර්.ඒ.විජේසිංහ මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 42 | එස්.එස්.බියන්විල මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 43 | ඒ.අයි.එල්.සිරිසේන මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 44 | එස්.ඒ.ජී.ඩී.එන්. ජයකොඩි මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 45 | ආර්.ඩබ්.ඒ.එච්.රාජසේකර මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 46 | එච්.යූ.රත්නායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 47 | හිරන්ති දීගල මෙනෙවිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර |
| 48 | එම්.කේ. යසවර්ධන මයා | රියදුරු |
| 49 | ටී.කේ. ෂාම් නිශාන්ත මයා | රියදුරු |
| 50 | කේ.පී.සිරිසෝම මහතා | රියදුරු |
| 51 | ජී.පී.ඩී.සී.පී.ගුණරත්න මහතා | රියදුරු |
| 52 | ඩී.පී.ජේ.බී.දසනායක මහතා | රියදුරු |
| 53 | ඩබ්.ඒ හේමසිරි මයා | කාර්යාල කාර්ය සහායක |
| 54 | ටී.ජී. ආනන්ද මයා | කාර්යාල කාර්ය සහායක |
| 55 | ඒ.එන්.සී ද අල්විස් මයා | කාර්යාල කාර්ය සහායක |
| 56 | ඩබ්. නන්දන මයා | කාර්යාල කාර්ය සහායක |
| 57 | සුසන්ත ප්‍රභාත් මයා | කාර්යාල කාර්ය සහායක |
| 58 | පී.ඒ.තිලකසිරි අප්පුහාමි මයා | කාර්යාල කාර්ය සහායක |
| 59 | ගමගේ නිමල් මයා | කාර්යාල කාර්ය සහායක |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.1 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය

**වගු අංක - 11 ස්ත්‍රී පුරුෂ භාවය හා වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය**

| අනු අංකය | වයස් කාණ්ඩය | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| 01 | 25 අඩු | 00 | 00 |
| 02 | 26-35 | 10 | 04 |
| 03 | 36-45 | 13 | 13 |
| 04 | 46-50 | 04 | 05 |
| 05 | 51-55 | 06 | 03 |
| 06 | 55 වැඩි | 00 | 01 |
| **එකතුව** | | **33** | **26** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.2 ස්ථාන මාරුවීම්

රාජ්‍ය සේවයේ සාමාන්‍ය පරිපාටීන්ට අනුකූලව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ද ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2013 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලැබූ සංඛ්‍යාව 21 ක් හා වෙනත් තනතුරු සඳහා පත්වීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව 01 ක් විය.

ලේඛනය - 02 **2013 වර්ෂයේ ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලද දිනය |
|---|---|---|---|
| 01 | අසංග දයාරත්න මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2013.05.13 |
| 02 | ආර්.කේ.ජී.ඩී.කේ.විජේසිංහ මිය | අධ්‍යක්ෂ | 2013.03.04 |
| 03 | ජී.ඩී.අනුර පියබන්දු මහතා | අධ්‍යක්ෂ | 2013.09.23 |
| 04 | කේ.ජී.ප්‍රදීප් පුෂ්පකුමාර මහතා | අධ්‍යක්ෂ | 2013.12.06 |
| 05 | කේ.ආර්.පරණවිතාන මහතා | පර්යේෂණ සහකාර | 2013.06.18 |
| 06 | ඒ.කේ.පී.නිල්මිණී මිය | පර්යේෂණ සහකාර | 2013.08.16 |
| 07 | ඩබ්.එස්.එස්.පුෂ්පකාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.01 |
| 08 | ඒ.ආර්.සහිදීන් මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.01 |
| 09 | එච්. යූ.එන්.පොන්සේකා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.01 |
| 10 | ආර්.විජේසේකර මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.01 |
| 11 | එච්.ඩී.එල්.කුමුදුනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.01 |
| 12 | ඩබ්.එස්.එස්.පී.පුනාන්දු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.01 |
| 13 | ඩබ්.එස්.කේ.මාලගම්මන මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.01 |
| 14 | ජී.එස්.ආර්.ඒකනායක මහතා | කාර්යාල සේවක සේවය | 2013.01.04 |
| 15 | ඩබ්.ජී.ජී.ඒ.ඩී.එම්.ඩයස් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.15 |
| 16 | ජී.ජී.එන්.එස්.රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.15 |
| 17 | බී.එස්.ඒ.ඩබ්.පී.සතරසිංහ මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.27 |
| 18 | එස්.ඩී.එන්.එල්.දේවප්‍රිය මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.05.08 |
| 19 | ජී.එල්.ආර්.විද්‍යාලංකාර මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.11.05 |
| 20 | ආර්.සී.කරුණාරත්න මහතා | රියදුරු | 2013.05.23 |
| 21 | ජේ.පී.ජෝතිවංශ මහතා | රියදුරු | 2013.10.23 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

**ලේඛනය - 03** **වෙනත් තනතුරු සඳහා පත්වීම් ලද නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | පත්වීම් ලද දිනය |
|---|---|---|---|
| 01 | කේ.ටී.පී.රන්සිමාලි මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.07.12 |

2013 වර්ෂය තුළ ස්ථාන මාරුවීම් ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන් සංඛ්‍යාව 21 ක් විය. මොවුන් විවිධ රාජ්‍ය ආයතනවල සේවය කර අත්දැකීම් ලද පිරිසක් විය.

**ලේඛනය – 04** **2013 වර්ෂය තුළ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | කේ.ආර්.උඩුවාවල මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2013.05.06 |
| 02 | එම්.ජී.ලලිත් ආනන්ද මහතා | අධ්‍යක්ෂ | 2013.03.06 |
| 03 | ඩබ්.ඩී.සේපාලිකා මිය | සහකාර අධ්‍යක්ෂ | 2013.06.03 |
| 04 | පී.චාමිකා මධුවන්ති මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | 2013.06.28 |
| 05 | ඒ.එම්.ගුණරත්න මැණිකේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.02 |
| 06 | ඩී.පී.එස්.ජයසේකර මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.02 |
| 07 | ඒ.එම්.එස්.එස්.කේ.අරම්පත් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.09 |
| 08 | ඩබ්.ජේ.පේරුසිංහ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.15 |
| 09 | ආර්.රමණී මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.02.14 |
| 10 | ආර්.ඒ.විජේසිංහ මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.02.28 |
| 11 | එච්.යූ.රත්නායක මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.02 |
| 12 | ඒ.අයි.එල්.සිරිසේන මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.04.24 |
| 13 | එස්.එස්.බියන්විල මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.05.07 |
| 14 | එස්.ඩී.එන්.එල්.දේවප්‍රිය මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.02 |
| 15 | ජී.එල්.ආර්.විද්‍යාලංකාර මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2013.01.02 |
| 16 | ජී.පී.ඩී.සී.පී.ගුණරත්න මහතා | රියදුරු | 2013.01.02 |
| 17 | ඩී.එම්.ජේ.බී.දසනායක මහතා | රියදුරු | 2013.04.01 |
| 18 | ජේ.පී.ජෝතිවංශ මහතා | රියදුරු | 2013.10.03 |
| 19 | කේ.පී.සිරිසෝම මහතා | රියදුරු | 2013.05.27 |
| 20 | පී.ඒ.තිලකසිරි අප්පුහාමි මහතා | කාර්යාල සේවක සේවය | 2013.01.02 |
| 21 | ජී.නිමල් ගමගේ මහතා | කාර්යාල සේවක සේවය | 2013.03.28 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.3 පුහුණු වැඩසටහන්

### 5.3.1 දේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්ය සාධන වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සැලසුම්ගතව පැවැත්වීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කරනු ලැබේ. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අවශ්‍යතා මෙන්ම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන්ද මෙම වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ. ඒ අනුව 2013 වර්ෂය තුළ ලබා දුන් පුහුණු වීම් වගු අංක 12 මගින් දක්වා ඇත.

**වගු අංක -12 පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම**

| අනු අංකය | ක්ෂේත්‍රය | පුහුණු ආයතනය | සහභාගී වූ ගණන |
|---|---|---|---|
| 01 | දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව | කැළණිය විශ්ව විද්‍යාලය | 01 |
| 02 | මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය | කොළඹ විශ්ව විද්‍යාලය | 01 |
| 03 | උසස් පරිගණක පුහුණු පාඨමාලාව | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 01 |
| 04 | උපායමාර්ගික චින්තනය සහ උසස් සංවිධානික කාර්යසාධනය සඳහා අරමුණු පිහිටුවීම | ශ්‍රී ලංකා මහ බැංකුව | 02 |
| 05 | කළමනාකරණ සහකාර සහ සමාන්තර ශ්‍රේණි සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 10 |
| 06 | දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය | 21 |
| 07 | ඉහළ ශ්‍රම ඵලදායිතාවය සඳහා කාර්යභාරය | ශ්‍රම අධ්‍යයන ආයතනය | 02 |
| 08 | සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු පාඨමාලාව | සඳතැන්න ශ්‍රී ලංකා වන විද්‍යායතනය, නුවරඑළිය | 60 |
| 09 | පරිගණක විද්‍යාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය | 01 |
| **එකතුව** | | | **99** |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 5.3.2 විදේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ට විදේශීය පුහුණු අවශ්‍යතා ලබා දෙමින් ඔවුන්ගේ අත්දැකීම් හා විෂය දැනුම වර්ධනය කිරීමට 2013 වර්ෂය තුළදී ද කටයුතු කරන ලදී. ඒ අනුව නිලධාරීන් 13 දෙනෙකුට විදේශීය පුහුණු අවස්ථාවන් හිමි විය.

**විදේශීය පුහුණු -2013**

| අනු අංකය | නම | තනතුර | ලැබූ පුහුණුව | රට | කාලය |
|---|---|---|---|---|---|
| 01 | කේ.ජී.ප්‍රදීප් පුෂ්පකුමාර මහතා | අධ්‍යක්ෂ | ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විධායක පුහුණු පාඨමාලාව | සිංගප්පූරුව | 2013.03.18 2013.03.22 |
| 02 | ඒ.කේ.පී.නිල්මිණි මිය | පර්යේෂණ සහකාර | ආසියාතික රටවල රේගු පරිපාලනය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2013.04.08 2013.04.28 |
| 03 | ඒ.එම්.අසංග දයාරත්න මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ආයෝජනය හා ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | සිංගප්පූරුව | 2013.05.06 2013.05.10 |
| 04 | එස්.එන්.අත්තනායක මිය | සහකාර අධ්‍යක්ෂ | විදේශ සෘජු ආයෝජන හා තිරසාර සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2013.06.08 2013.06.28 |
| 05 | එන්.ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් | ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විධායක පුහුණු පාඨමාලාව | සිංගප්පූරුව | 2013.07.01 2013.07.05 |
| 06 | එම්.කේ.එස්.ජයසේන මිය | සහකාර අධ්‍යක්ෂ | ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විධායක පුහුණු පාඨමාලාව | සිංගප්පූරුව | 2013.07.01 2013.07.05 |
| 07 | එම්.ඒ.කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ | ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විධායක පුහුණු පාඨමාලාව | සිංගප්පූරුව | 2013.07.01 2013.07.05 |
| 08 | එම්.ජී.ලලිත් ආනන්ද මයා | අධ්‍යක්ෂ | ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විධායක පුහුණු පාඨමාලාව | සිංගප්පූරුව | 2013.07.01 2013.07.05 |
| 09 | පී.චාමිකා මධුවන්ති මෙය | සහකාර අධ්‍යක්ෂ | ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විධායක පුහුණු පාඨමාලාව | සිංගප්පූරුව | 2013.07.01 2013.07.05 |
| 10 | එස්.එන්.අත්තනායක මිය | සහකාර අධ්‍යක්ෂ | ඊ පාලනය හා විපරිණාම කළමනාකරණය | සිංගප්පූරුව | 2013.07. 15 2013.07.19 |
| 11 | ඩබ්.පී.සෙව්වන්දි මෙය | සහකාර අධ්‍යක්ෂ | ඊ පාලනය හා විපරිණාම කළමනාකරණය | සිංගප්පූරුව | 2013.07. 15 2013.07.19 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | ඩබ්.පී.සෙව්වන්දි මෙය | සහකාර අධ්‍යක්ෂ | ආර්ථික සංවර්ධන රටාව සහ තිරසාරත්වය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2013.07.22<br>2013.08.15 |
| 13 | ඩබ්.එච්.ජී.ජී.කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ | අමාත්‍යාංශයේ විධායක කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන | සිංගප්පූරුව | 2013.07.29<br>2013.08.02 |
| 14 | ඩබ්.එච්.ජී.ජී.කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ | කලාපීය මෙහෙයුම් සංවිධාන පද්ධති ප්‍රමුඛතාකරණය පිළිබඳ පාඨමාලාව | චීනය | 2013.08.26<br>2013.09.24 |
| 15 | පී.චාමිකා මධුවන්ති මෙය | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධන උපායමාර්ග පිළිබඳ සම්මන්ත්‍රණය | කොරියාව | 2013.09.01<br>2013.09.14 |
| 16 | කේ.ආර්.උඩුවාවල මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | මානව සංවර්ධනයෙහිදී හැකියා වර්ධනය | ඉන්දියාව | 2013.10.29<br>2013.11.01 |
| 17 | බී.එම්.සරත් මයා | පර්යේෂණ සහකාර | ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2013.11.06<br>2013.11.26 |
| 18 | එම්.එම්.ඒ.එන්.මල්පෝරු මිය | පර්යේෂණ සහකාර | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා දූපත් ආර්ථිකය පිළිබඳ සමුලුව | චීනය | 2013.11.06<br>2013.11.26 |
| 19 | කේ.ආර්.උඩුවාවල මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | ඊ පාලනය හා විපරිණාම කළමනාකරණය | සිංගප්පූරුව | 2013.11.29<br>2013.12.03 |

## 5.4 වාර්ෂික තැපැල

2013 වසරේ දෙපාර්තමේන්තුවට ලැබුණු ලිපි සංඛ්‍යාව 6320 ක් විය. මෙම ලිපි විවිධ විෂයන් සම්බන්ධයෙන් ලැබී තිබුණු අතර රාජ්‍ය ආයතන සඳහා නව තනතුරු ඇති කර ගැනීම, පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලීම්, පැහැදිලි කරගැනීම් හා සාමාන්‍ය පරිපාලනය යන විෂයන් ප්‍රධාන තැනක් ගෙන තිබුණි.

**වගු අංක - 13** **2013 වර්ෂය තුල ලැබුණු ලිපි සංඛ්‍යාව**

| අනු අංකය | මාසය | ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජනවාරි | 605 |
| 02 | පෙබරවාරි | 561 |
| 03 | මාර්තු | 424 |
| 04 | අප්‍රියෙල් | 465 |
| 05 | මැයි | 480 |
| 06 | ජූනි | 550 |
| 07 | ජූලි | 533 |
| 08 | අගෝස්තු | 505 |
| 09 | සැප්තැම්බර් | 501 |
| 10 | ඔක්තෝබර් | 495 |
| 11 | නොවැම්බර් | 408 |
| 12 | දෙසැම්බර් | 793 |
| **එකතුව** | | **6320** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 6. මූල්‍ය අංශය

2013 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩසටහන යටතේ මානව සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 242 වැය ශීර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.50,400,000/- ක් වූ අතර සත්‍ය වියදම රු.36,268,168.16 ක් විය. ඒ අනුව වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් 71% ක් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කර ඇත. මූල්‍ය ප්‍රගති වාර්තාව පහත පරිදි වේ.

වගු අංක - 14 මූල්‍ය ප්‍රගති වාර්තාව


| වැය විස්තරය | | 2012 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත ප්‍රතිපාදනය (අවුරා තබන ලද ප්‍රතිපාදන හැර) (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය % | අනුමත ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය % |
| **පුනරාවර්තන වියදම්** | | **32,800,000.00** | **30,884,182.91** | **94** | **35,200,000.00** | **32,777,099.21** | **93** |
| පුද්ගල පඩිනඩි | | 23,760,000.00 | 22,931,076.91 | 97 | 24,700,000.00 | 23,608,354.85 | 95 |
| 1001 | වැටුප් හා වේතන | 16,150,000.00 | 15,358,040.70 | 95 | 17,000,000.00 | 1,525,9204.69 | 89 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 715,000.00 | 693,128.46 | 97 | 700,000.00 | 818,713.66 | 1.16 |
| 1003 | වෙනත් දීමනා | 6,895,000.00 | 6,879,907.75 | 99 | 7,000,000.00 | 7,530,436.50 | 1.07 |
| **ගමන් වියදම්** | | **435,000.00** | **401,557.72** | **92** | **1,000,000.00** | **893,691.18** | **89** |
| 1101 | දේශීය | 100,000.00 | 77,425.50 | 77 | 200,000.00 | 128,445.00 | 64 |
| 1102 | විදේශීය | 335,000.00 | 324,132.22 | 97 | 800,000.00 | 765,246.18 | 95 |
| සැපයීම | | 3,785,000.00 | 3,168,916.10 | 84 | 4,000,000.00 | 3,784,035.79 | 94 |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,055,000.00 | 1,002,952.60 | 95 | 800,000.00 | 1,488,982.90 | 1.86 |
| 1202 | ඉන්ධන | 2,500,000.00 | 2,013,293.50 | 81 | 3,000,000.00 | 2,049,947.19 | 68 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 180,000.00 | 152,535.00 | 85 | 150,000.00 | 245,105.70 | 1.63 |
| 1205 | වෙනත් | 50,000.00 | 135.00 | 0 | 50,000.00 | 0.00 | 0 |
| **නඩත්තු වියදම්** | | **1,000,000.00** | **897,587.52** | **90** | **1,100,000.00** | **1,028,196.64** | **93** |
| 1301 | වාහන | 830,000.00 | 818,278.12 | 99 | 800,000.00 | 877,795.12 | 1.09 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 170,000.00 | 79,309.40 | 47 | 300,000.00 | 150,401.52 | 50 |
| **සේවා** | | **3,070,000.00** | **2,895,020.96** | **94** | **3,500,000.00** | **2,656,612.75** | **75** |
| 1401 | ප්‍රවාහන | 1,400,000.00 | 1,312,435.50 | 94 | 1,500,000.00 | 1,060,440.00 | 70 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,200,000.00 | 1,174,399.93 | 98 | 1,500,000.00 | 1,099,998.91 | 73 |
| 1405 | වෙනත් | 470,000.00 | 408,185.53 | 87 | 500,000.00 | 496,173.84 | 99 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **මාරු කිරීම්** | | **750,000.00** | **701,285.29** | **95** | **900,000.00** | **806,208.00** | **89** |
| 1506 | රජයේ නිලධාරීන් සඳහා දේපළ ණය පොළී | 750,000.00 | 701,285.29 | 94 | 900,000.00 | 806,208.00 | 89 |
| **මූලධන වියදම්** | | **1,450,000.00** | **862,278.85** | **59** | **15,200,000.00** | **3,491,068.95** | **22** |
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම** | | **636,000.00** | **566,023.85** | **89** | **10,900,000.00** | **269,328.85** | **02** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 36,000.00 | 35,140.06 | 98 | 10,000,000.00 | 0.00 | 0 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000.00 | 77,564.00 | 78 | 400,000.00 | 18,654 | 4 |
| 2003 | වාහන | 500,000.00 | 453,319.79 | 91 | 500,000.00 | 250,674.85 | 50 |
| **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | | **153,000.00** | **96,995.00** | **63** | **3,500,000.00** | **2,728,436.10** | **77** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | **153,000.00** | **96,995.00** | 63 | 3,000,000.00 | 2,728,436.10 | 90 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | **-** | **-** | - | 500,000.00 | 500,000.00 | 0 |
| **හැකියා වර්ධනය** | | **661,000.00** | **199,260.00** | **30** | **800,000.00** | **493,304.00** | **61** |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 661,000.00 | 199,260.00 | 30 | 800,000.00 | 493,304.00 | 61 |
| **මුළු එකතුව** | | **34,250,000.00** | **31,857,723.35** | **93** | **50,400,000.00** | **36,268,168.16** | **71** |

මූලාශ්‍රය : ගිණුම් අංශය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

**සංවිධාන ව්‍යුහය**

**කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**




○ සහායක කාර්ය මණ්ඩලය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, රාජ්‍ය කළමනාකරණ සහකාර, රියදුරු, කාර්යාල කාර්ය සහායක